www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එල්ටීටීඊය තුල භේදය ශ්‍රී ලංකාවේ යුද තර්ජනය උත්සන්න කරයි

**A split in the LTTE heightens danger of war in Sri Lanka**

**කේ. රත්නායක විසිනි**
**2004 මාර්තු 18**

දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ උතුරු හා නැගෙනහිර අංශයන් අතර ප්‍රධාන භේදයක් හටගෙන ඇත. එය, ශ්‍රී ලංකාවේ වත්මන් සටන් විරාමයට වල කැපීමේත් රට යලි සිවිල් යුද්ධය කරා ඇද දැමීමේත් හැකියාවෙන් යුක්ත ය. මේ අවස්ථාවේ සටනක් ඇවිලී නැති නමුත්, එල්ටීටීඊ කඳවුරු දෙක ආන්තික ආතතියකින් යුක්තව මුහුනට මුහුනලා සිටින අතර, ශ්‍රී ලංකා මිලිටරියේ යම් මැදිහත්වීමකින් එම තතු තවත් තීව්‍ර විය හැකි ය.

මාර්තු 3 දා, එල්ටීටීඊයේ නැගෙනහිර පලාතේ මිලිටරි අන දෙන නිලධාරි, කරුනා නමින් ද හැඳින්වෙන, වී. මුරලිදරන්, භේදය තථ්‍ය වසයෙන් ම විධිමත් කරමින් ලිපි දෙකක් ලිවී ය. එල්ටීටීඊ නායක ප්‍රභාකරන් වෙත එවූ පලමුවැන්න, එල්ටීටීඊයේ නැගෙනහිර අංශයට "ස්වාධීනව ක්‍රියාත්මක" වීමට ඉඩ දෙන ලෙස ද නැගෙනහිර මඩකලපු-අම්පාර දිස්ත්‍රික්ක සඳහා වෙනම පරිපාලන ව්‍යුහයක් ද ඉල්ලා සිටියේ ය. වත්මන් සටන් විරාමය අධීක්ෂනය කරන ශ්‍රී ලංකා නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) වෙත ලියූ දෙවැන්න, කොලඹ ආන්ඩුව සමග වෙනම යුද විරාම ගිවිසුමක් ඉල්ලා සිටියේ ය.

උතුරේ වන්නි ප්‍රදේශයේ පාදකව සිටින එල්ටීටීඊයේ මධ්‍යම නායකත්වය, පලමුව, අර්බුදය අඩු තක්සේරු කිරීමට උත්සාහ කලේ, එය "තාවකාලික" තත්වයක් බවට විස්තර කරමිනි. එහෙත් මාර්තු 6 දා, දේශපාලන අංශයේ නායක එස්. තමිල්චෙල්වම් නිවේදනයක් නිකුත් කරමින්, මුරලිදරන් සංවිධානයෙන් ඉවත් කොට ඒ තැනට ඔහුගේ දෙවැනියා වූ ටී. රමේෂ් පත් කල බවත්, නැගෙනහිර ප්‍රාදේශීය තනතුරුවලට ප්‍රභාකරන්ට හිතපක්ෂපාතී සෙසු අය නම් කල බවත් පැවසී ය. මුරලිදරන්ගේ පියවර, "දෙමල විමුක්ති අරගලයට" විරුද්ධ "සමහර දුෂ්ඨ කොටස් විසින් උසිගන්වන" ලද බවත් ඔහු "දෙමල ජනයාට ද්‍රෝහී ලෙස" ක්‍රියා කොට ඇති බවත් තමිල්චෙල්වම් ප්‍රකාශ කලේ ය.

සිය දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව ප්‍රචන්ඩත්වය යොදාගැනීම පිලිබඳ ප්‍රසිද්ධ මෙවන් සංවිධානයක් තුල, තමිල්චෙල්වම්ගේ ප්‍රකාශය, මරන වරෙන්තුවකට සම වේ. කෙසේ වෙතත්, මුරලිදරන් යටතේ, ගරිල්ලා සටන්කරුවන් 5,000ත් 6,000ත් අතර ප්‍රමානයක්, එනම්, එල්ටීටීඊයේ මුලු මිලිටරි බලකායෙන් තුනෙන් පංගුවක් පමන, සිටිතැයි තක්සේරු කෙරේ. භේදයෙන් පසුව වන්නියට පලා ගිය රමේෂ්ට සහ නව තනතුරුවලට පත් කල සෙසු අයට, සිය තනතුරු භාරගනු පිනිස නැගෙනහිරට පෙරලා ඒමට තවමත් නොහැකිව පවතී.

පසු බසිනවා වෙනුවට, මුරලිදරන් සිය දුක්ගැනවිලි ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කොට, මඩකලපු හා අම්පාර දිස්ත්‍රික්ක තුල දේශපාලන සහයෝගය සංකේන්ද්‍රනය කරගැනීමේ ප්‍රයත්නයක යෙදී ඇත. ඔහු *ඇසෝසියේටඩ් ප්‍රෙස්* පුවත් සේවයට මෙසේ පැවසී ය: "සංහිඳියාව පිලිබඳ ප්‍රශ්නයක් පැන නොනගී. සෑම දෙයක් ම සංහිඳියාවෙන් ඔබ්බට ගමන් කොට ඇත. අනාගතයේ දී අපි පූර්න ස්වයං-පාලනයක් (නැගෙනහිර) පවත්වා ගෙන යන්නෙමු." මාර්තු 11 දා *රොයිටර්* ප්‍රවෘත්ති සේවයට කතා කරමින්. ඔහු, තමන් දෙමල ජනයාගේ එකම නියෝජිතයා බවට එල්ටීටීඊය දිගුකලක් තිස්සේ කරන කියාපෑම ප්‍රතික්ෂේප කොට, ප්‍රභාකරන්ට "සාධනීය නායකත්ව ගුනාංග නැති" බව ප්‍රකාශ කලේ ය.

පසුගිය සති දෙක තුල, දෙපාර්ශ්වය ම, සිය ග්‍රහනයන් ඇඩි කර ගැනීමේ ප්‍රයත්නයක යෙදී තිබේ. ප්‍රතිවාදී කඳවුරට පක්ෂපාතිත්වය දක්වන්නේ යයි සැක කෙරුනු එල්ටීටීඊ කාඩර්වරුන් සිය ගනනක්, ප්‍රදේශ දෙක ම තුල, කොටු කොට රඳවා ගෙන ඇතැයි වාර්තා වේ. පසුගිය සතියේ දී මුරලිදරන්ගේ ආධාරකරුවන් මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රදේශ ගනනාවක පෙලපාලි සංවිධානය කල අතර එහි දී ප්‍රභාකරන්ගේ හා එල්ටීටීඊ රහස් ඔත්තු අංශයේ නායක පොට්ටු අම්මාන්ගේ පඹයන් පුලුස්සන ලදි. උතුරෙන් මඩකලපුව හා අම්පාර ප්‍රදේශවලට පැමින සිටි විශ්වවිද්‍යාල සිසුන් හා ව්‍යාපාරිකයන් ගනනාවක් එක්කෝ පලා ගොස් ඇත, නැත හොත් පලවා හරිනු ලැබ ඇත.

පසුගිය සති අන්තයේ *සන්ඩේ ටයිම්ස්* පත්‍රයේ "තත්ව වාර්තාවට" අනුව, මුරලිදරන්, සිය පාලනය යටතේ පවත්නා ප්‍රදේශවලට පිවිසෙන දොරටු වසා දමා ඇත. "ත්‍රිකුනාමලය හා මඩකලපුව දිස්ත්‍රික්ක අතර සීමාවේ, ගැටුමක් අවුලුවාලිය හැකි ගිනිපුපුරු පවතින

බවක් පෙනෙයි. ත්‍රිකුනාමලයේ දකුනේ, ප්‍රභාකරන් මහතාට පක්ෂපාතී 1,500කට අධික කේඩර්වරු පිරිසක් රැස්ව ඇති බව කියනු ලැබේ." නැගෙනහිර අන දෙන නිලධාරි මෙයට ප්‍රතිචාර දක්වා ඇත්තේ, සෝදිසි ස්ථාන ශක්තිමත් කිරීමත් නව බංකර් ඉදි කිරීමත් පිනිස, මඩකලපුව උතුරට තවත් සටන්කරුවන් 300ක් එවීම මගිනි.

මේ වන තෙක් ම, මුරලිදරන් ප්‍රභාකරන්ට පක්ෂපාතී ලුතිනන්වරයකු ලෙස සිටියේ ය. දිගු කාලයක් තිස්සේ නැගෙනහිර අන දෙන නිලධාරි ලෙස සිටින මොහු, 2002 අප්‍රේල් මස වන්නියේ පැවති එල්ටීටීඊයේ ප්‍රථම ප්‍රසිද්ධ ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී, එල්ටීටීඊ නායකයා සමග එකට වාඩි වී සිටියේ ය. ඔහු කොලඹ ආන්ඩුව සමග පැවති සාම සාකච්ඡාවලට සහභාගි වූ එල්ටීටීඊ නියෝජිත කන්ඩායමට ද ඇතුලත් විය.

සිය දුක්ගැනවිලි ඉදිරිපත් කරමින්, වන්නියට සටන්කරුවන් 1000ක් එවන ලෙස තමන්ට අන කල බව මාධ්‍යවලට පැවසූ මුරලිදරන්, එම පියවර මගින් යලි යුද්ධය ඇරඹීම පිනිස වන සූදානමක් පෙන්නුම් කරන බව කියා පෑවේ ය. අප්‍රේල් 2 දා මැතිවරනයට තරග වදින එක්සත් ජාතික පෙරමුනේ (එජාපෙ) අපේක්ෂකයන් දෙදෙනෙකු ඝාතනය කිරීම පිටුපස පොට්ටු අම්මාන් සිටින බවට ද ඔහු චෝදනා කලේ ය. ඔහු එකදු චෝදනාවකට වත් සාක්ෂි ඉදිරිපත් කලේ නැත. එම චෝදනා දෙකම, එජාපෙ ආන්ඩුව වෙතින් සානුකම්පිත ප්‍රතිචාරයක් දිනාගැනීමේ එල්ලයෙන් සිදු කල බව පෙනී යයි. ප්‍රභාකරන් නායකත්වය මෙම චෝදනා දෙක ම ප්‍රතික්ෂේප කොට ඇත.

මතභේදයේ මූලික කරුන කේන්ද්‍රගත වන්නේ, "සාම ක්‍රියාදාමයේ" වාසි තමන්ට අහිමි කරනු ලැබ ඇතැයි, එල්ටීටීඊයේ නැගෙනහිර අංශය කරන පැමිනිලි මත ය. එහි දේශපාලන අංශය විසින් මාර්තු 4 දා නිකුත් කරන ලද පොත් පිංචක් මෙසේ ප්‍රකාශ කලේ ය: "මඩකලපු-අම්පාර දිස්ත්‍රික්කවල එල්ටීටීඊ කේඩර දහස් ගනනක් උතුරේ සටන්වලට සහභාගි වී තිබේ. . . . එහෙත් ඔවුන් උපන් දිස්ත්‍රික්කය දිගටම නො තැකීමට ලක්ව ඇත."

පොත් පිංචට අනුව, එල්ටීටීඊයේ පරිපාලන මන්ඩල 30න් එකක වත් ප්‍රධානීන් නැගෙනහිරෙන් පැමිනි අය නො වේ. නැගෙනහිර දිස්ත්‍රික්කවලින් පැමිනෙන කේඩර උතුරේ ඉහල කාර්යධරයන්ට ආරක්ෂාව සපයන අතර, එම නිලධාරිහු "සිය සුඛෝපභෝගී රථවල ඔබ මොබ යති." එල්ටීටීඊයේ යෝජිත අන්තර් පාලනය ගැන සඳහන් කරමින්, එය තව දුරටත් මෙසේ පවසයි: "එල්ටීටීඊය උතුරු හා නැගෙනහිර පලාත්වල පිහිටුවීමට යන අන්තර් ස්වයං පාලන අධිකාරිය යටතේ තමන්ට යුක්තිය ඉෂ්ඨ වේ ද යන්න පිලිබඳව, අපගේ ජනතාව සැක පහල කරයි."

පසුගිය සති අන්තයේ *සන්ඩේ ටයිම්ස්* පත්‍රය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී, මුරලිදරන්, "සම්පත් අසමානව බෙදාහැරීමක්" පිලිබඳව වන්නි නායකත්වයට චෝදනා කලේ ය. "නැගෙනහිර සොල්දාදුවන් තුවක්කු බත් ලෙස යොදා ගැනේ. නැගෙනහිර අපගේ සංවිධානය පවත්වා ගෙන යාමේ දී සහ ජනතාවගේ සුබ සෙත උදෙසා සංවර්ධන වැඩකටයුතු ගෙන යාමේ දී අපි දැනටමත් අසීරුතාවන්ට මුහුන දෙමු. වන්නියේ දී මුදල්වලට කුමක් සිදු වේ ද යන්න අපිට තේරුම් ගත නො හැක. ඔවුහු බදු එකතු කිරීමෙන් පමනක් මසකට රුපියල් මිලියන 500ක් පමන උපයති." යයි ඔහු පැවසී ය.

### එල්ටීටීඊයට එරෙහිව වැඩෙන වෛරය

මෙම හැඟීම්, නැගෙනහිර හා උතුර යන දෙපලාතේ ම ජනගහනයේ පුලුල් ස්ථර අතර එල්ටීටීඊය සම්බන්ධයෙන් පවත්නා වැඩෙන අමනාපය, පැහැදිලිවම පිලිබිඹු කරයි. ආන්ඩුව හා එල්ටීටීඊය අතර සටන් විරාම ගිවිසුම අත්සන් කොට වසර දෙකක් ගතවීමෙන් අනතුරුව, රටේ යුද කලාපයේ වෙසෙන ජනයාගෙන් බහුතරයක් — දෙමල, සිංහල හා මුස්ලිම් යන ජනවර්ග තුනටම අයත් — තවමත් දරිද්‍ර කොන්දේසි යටතේ දිවි ගෙවයි. නිවාස හා ව්‍යාපාරික ස්ථාන බොහෝ ගනනක් විනාශයට ලක්ව ඇත. සෙසු අයට, ශ්‍රී ලංකා මිලිටරියේ ආඥාවන්ට යටත්ව පවත්නා අධි ආරක්ෂක කලාප තුල පිහිටි සිය ඉඩම් නිවාස වෙත ආපසු යාමට, අවසර ලැබී නැත.

ඊනියා සාම ක්‍රියාදාමයෙන් වාසි ලැබී ඇත්තේ, එල්ටීටීඊ නායකත්වයේ තුනී තට්ටුවකට පමනක් වන අතර ඔවුහු සිය විරුද්ධවාදීන්ට එරෙහිව තර්ජන හා මැර බලය යොදා ගැනීමට කිසිසේත්ම පසුබට වී නැත. එජාපෙ අපේක්ෂකයන් දෙදෙනෙකු ඝාතනය කිරීම, දේශපාලන ප්‍රචන්ඩත්වයේ හා ඝාතනවල දීර්ඝ ලැයිස්තුවේ මෑතම සිද්ධිය පමනි. 2002 දී, උතුරේ යාපන අර්ධද්වීපයට නුදුරින් පිහිටි කයිට්ස් දූපතේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජිකයන් ධීවර සමුපකාර සමිතියක මුදල් එල්ටීටීඊයට ලබාදීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව, එහි එල්ටීටීඊ ප්‍රාදේශීය නායකයෝ, එම සසප සාමාජිකයන්ට එරෙහිව මරන තර්ජන එල්ල කලහ.

එල්ටීටීඊය සමග මොන යම් හෝ දෘෂ්ටිමය බිඳීමක් නියෝජනය කරනවා වෙනුවට, මුරලිදරන්ගේ භේදය, පදනම් වී ඇත්තේ, සමස්තයක් ලෙස එල්ටීටීඊයේ බෙදුම්වාදී වැඩපිලිවෙලට යටින් පවත්නා තර්කනය මත ම ය. 1970 ගනන්වල දී, කොලඹ ආන්ඩුව විසින් ක්‍රියාවට දමන ලද වෙනස්කම් කිරීමේ පිලිවෙත් හා ආර්ථික බාධක සම්බන්ධයෙන්, දෙමල තරුනයන්, කම්කරුවන් හා ගොවීන් අතර පැනනැගුනු යුක්තියුක්ත වෛරය, උතුරේ හා නැගෙනහිර දෙමල ඊලම් නමින් වෙනම ධනපති රාජ්‍ය නට්ටක් පිලිබඳ වර්ගවාදී ඉල්ලීම කරා අපසරනය කිරීමට, එල්ටීටීඊය ක්‍රියා කලේ ය.

දැන් මුරලිදරන්, "උතුරේ දෙමල ජනයාට" එරෙහි "නැගෙනහිර දෙමල ජනයාගේ" වත්මන් හා අතීත දුක්ගැනවිලි යොදා ගන්නේ, මඩකලපුව හා අම්පාර

සඳහා වෙනම පරිපාලනයක් ද ආන්ඩුව සමග ගෙන යන සාම සාකච්ඡාවල දී තමන්ට වෙන ම නියෝජනයක් ද ඉල්ලා සිටීම පිනිස ය. ඔහුට වත් ප්‍රභාකරන්ට වත්, දෙමල කම්කරුවන් හෝ පීඩිත ජනතාව මුහුන දෙන සමාජ අර්බුදයට මොන යම් හෝ විසඳුමක් නැත. ඒ වෙනුවට ඔවුන් එකිනෙකා නියෝජනය කරන්නේ, කොලඹ පාලනය සමග ඇති කරගැනෙන මොන යම් හෝ සාම සම්මුතියක දී, තමතමන්ගේ වාසිය උපරිම කරගැනීමට උත්සාහ කරන, දෙමල ධනේශ්වරයේ වෙනස් කොටස්වල අවශ්‍යතාවන් ය.

භේදය, "සාම ක්‍රියාදාමයේ" ම, ප්‍රතිගාමී ස්වභාවය අවධාරනය කරයි. 20 වසරක සිවිල් යුද්ධයට තුඩු දුන් යටින් පැවති දේශපාලන හා සමාජ ප්‍රශ්න එකකට හෝ අවධානය යොමු කරනවා වෙනුවට, සාම සාකච්ඡා මගින් ඉලක්ක කෙරී ඇත්තේ, කම්කරු පන්තිය හවුලේ සූරාකෑම පිනිස සිංහල, දෙමල හා මුස්ලිම් ප්‍රභූ කොටස් අතර බලය බෙදාගැනීමේ සැලසුමක් සැකසීම ය. ඉදිරිපත් කෙරී ඇති විවිධාකාර සැලසුම් සියල්ල ම මගින් කෙරෙන්නේ, වාර්ගික භේදයන් ශක්තිමත් කිරීම හා එනයින් ජනවාර්ගික, ආගමික හා දැන් ප්‍රාදේශීය රේඛා ඔස්සේ, නිමක් නැති නව ආතතීන්, භේදයන් හා ගැටුම් අවුලුවාලීම සඳහා මාවත සැකසීමයි.

මේ අවස්ථාවේ දී, එල්ටීටීඊයේ නැගෙනහිර කන්ඩායමට, කොලඹ පාලනයෙන් වත්, ශ්‍රී ලංකා නිරීක්ෂන කමිටුවෙන් (එස්එල්එම්එම්) වත් නිල පිලිගැනීමක් ලැබී නැත. නෝර්වේජියානුවන්ගේ නායකත්වයෙන් යුත් සටන් විරාම නිරීක්ෂකයෝ, මුරලිදරන්ගේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල සිය ක්‍රියාකාරකම් අත්හිටුවා තිබේ. ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යංශය, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්ක ආවරනය වන පරිදි, වෙනම සටන් විරාම ගිවිසුමක් වෙනුවෙන් මුරලිදරන් කර ඇති ඉල්ලීම, ප්‍රතික්ෂේප කොට ඇත. සිය හමුදාවන්, පෙර සටන් විරාම ගිවිසුමට තමන් බැඳී ඇතැයි, තව දුරටත් නො සලකන බවට ඔහු පෙරලා අනතුරු අඟවා ඇත.

එල්ටීටීඊයේ භේදය, දැනටමත්, අතිශයින්ම දහනශීලීව පවත්නා දේශපාලන තත්වයට, තවත් ගිනිගන්නා සුලු සාධකයක් එක් කොට තිබේ. ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග, සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග සන්ධානගතව, පසුගිය මාසයේ දී, ඡන්දයෙන් තේරී පත් වූ එජාපෙ ආන්ඩුව පලවා හැරියේ, සාම ක්‍රියාදාමය ජාතික ආරක්ෂාවට වල කපන බව ප්‍රකාශ කරමිනි. මෙම දේශපාලන වාතාවරනය තුල, මුරලිදරන්ගේ පියවරයන්ට කොලඹ පාලක කවයන් දක්වා ඇති ප්‍රතිචාරයන් ඒකාකාර නො වේ.

එල්ටීටීඊයේ භේදය, පැහැදිලිව ම, මහ ව්‍යාපාරිකයන් හා මහ බලවතුන් වෙනුවෙන්, දිවයින භූගෝලීය ආයෝජනයන්ට විවෘත කරලනු පිනිස, එජාපෙ ආන්ඩුව ඉදිරියට දමා ඇති ඊනියා සාම ක්‍රියාදාමය, කඩාකප්පල් කිරීමේ විභවයෙන් යුක්ත ය. මුරලිදරන් සමග වෙනම සාකච්ඡා ඇරඹීමට ගැනෙන ඕනෑම පියවරක්, අර්බුදයට ඇඟිලි නො ගසන ලෙස කොලඹ පාලනයට අනතුරු අඟවා ඇති, වන්නි නායකත්වය වෙතින් වෛරී ප්‍රතිචාරයක් අවුලුවාලනු ඇත. එහෙත්, මුරලිදරන් නැගෙනහිර පලාතේ සිය පාලනය තහවුරු කර ගන්නේ නම්, ඔහු නිකම් ම නො කතා හැරිය නො හැක.

එල්ටීටීඊයේ අභ්‍යන්තර අරගලය, අප්‍රේල් මැතිවරනයට තවත් අවදානම් සාධකයක් එක් කොට තිබේ. දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) නමින් දෙමල පක්ෂ කන්ඩායමක්, එල්ටීටීඊයේ නිල නො වන නියෝජිතයන් ලෙස මැතිවරනයට තරඟ කරයි. කලින්, ටීඑන්ඒ එජාපෙටත් එල්ටීටීඊය සමග එය ගෙනගිය සාකච්ඡාවන්ටත් සහාය දුනි. කෙසේ වෙතත්, දැන් පැනනැගිය හැක්කේ, ප්‍රාදේශීය රේඛා ඔස්සේ බෙදුනු ටීඑන්ඒ සන්ධානයකි. මුරලිදරන් කන්ඩායම, මේ සතියේ දී නැගෙනහිර ටීඑන්ඒ අපේක්ෂකයන්ට නියෝග පනවමින්, ප්‍රකාශ කොට සිටියේ, ඔවුන් වන්නි නායකත්වයෙන් භේද වී නැගෙනහිර ගැටලුවලට වැඩි අවධානයක් යොමු කල යුතු බවයි.

පාලක ප්‍රභූවේ එක කොටසක්, සාම ක්‍රියාදාමය බේරාගැනීමේ බලාපොරොත්තුවෙන්, එල්ටීටීඊයේ භේදයන් අඩු තක්සේරු කිරීමේ ප්‍රයත්නයක යෙදී සිටී. එජාපෙ ප්‍රකාශ කොට ඇත්තේ, එල්ටීටීඊයේ භේදය එම සංවිධානයේ අභ්‍යන්තර ප්‍රශ්නයක් බවයි. ජනාධිපති කුමාරතුංග, දැනට, මතභේදයට මැදිහත් නො වී දුරස්ථව සිටී. ඇගේ පාලනය යටතේ පවත්නා, ආරක්ෂක අමාත්‍යංශය, කන්ඩායම් දෙක අතර "යම් ගැටුමක් ඇතිවීම වැලැක්වීම" පිනිස, නැගෙනහිර පලාතේ සන්නද්ධ හමුදා "පූර්නව සීරුවෙන්" තබා ඇත.

මාර්තු 14 දා *සන්ඩේ ටයිම්ස්* පත්‍රයේ පල වූ කතුවැකියක්, ප්‍රවේසම් සහගත ආකල්පයක් ගැනීමේ අවශ්‍යතාව මෙසේ අවධාරනය කලේ ය: "භේදව සිටින කන්ඩායම්වලට තමන්ගේ ම ක්‍රමයන්ට ස්වකීය මතභේද විසඳාගැනීමට ඉඩ දීම හොඳම විකල්පය විය හැකි ය. මෙය, කොලඹ පාලනයේ පාර්ශ්වයෙන් නොතකා හැරීමක් ලෙස දැකිය යුතු නැත. එහෙත් එක් කන්ඩායමකට එරෙහිව අනෙකට සහාය දීම, ශ්‍රී ලංකාවේ සාමය කරා යන වේදනාකාරී ක්‍රියාදාමයට, හානිකර තත්වයක් ඇති කිරීමට, අනවශ්‍ය ලෙස දායක වනවා විය හැකි ය."

කොලඹ ප්‍රභූවේ සෙසු කොටස් අවධාරනය කරන්නේ, එල්ටීටීඊයේ භේදය, උපරිම වාසි ලබා ගැනීම පිනිස ගසාකෑ යුතු බවයි. මාර්තු 5 දා *දි අයිලන්ඩ්* පත්‍රයේ "අවසානයේ ආරම්භය ද?" යන මැයෙන් පල වූ කතුවැකියක් මෙසේ ප්‍රකාශ කලේ ය: "දශක දෙකක කාලයක් තිස්සේ මෙරට ත්‍රස්තයේ ග්‍රහනයට නතු කර ගෙන සිටි එල්ටීටීඊය තුල භේදයක් හටගෙන තිබේ නම්, එය එම සංවිධානය මුලුමනින්ම විනාශ කිරීම පිනිස වැඩ කරන සියලුම ජන කන්ඩායම්වල

අවශ්‍යතාව සඳහා වනු ඇත." "ඓතිහාසික අවස්ථාවක්" විය හැකි මෙම අවස්ථාව ඩැහැ ගැනීමට ඒකාබද්ධව කටයුතු කරන ලෙස එම කතුවැකිය වික්‍රමසිංහගෙන් හා කුමාරතුංගගෙන් ඉල්ලා සිටියේ ය.

ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ, මුරලිදරන් "සාධාරන හඬක්" ලෙස වර්නනාවට ලක් කොට, ඔහු "සමස්ත දෙමල ජනයාගේ ම හඬ බවට" පත් කල යුතු යයි ප්‍රකාශ කර තිබේ. කන්ඩායම් දෙක අතර සංහිඳියාවක් ඇති කිරීම පිනිස උත්සාහ කරන්නේ යයි එජාපෙ සහ "දේශීය හා ජාත්‍යන්තර කුමන්ත්‍රනකාරී බලවේග" හෙලා දැක්ක ඔහු, එවන් ප්‍රයත්නයන් "මහජනතාවට, විශේෂයෙන් ම ජනාධිපතිතුමියට අනතුරුදායක සංඥා යැවීමක්" යයි ද පැවසී ය. ඔහුගේ අදහස් දැක්වීම් සම වන්නේ, වන්නියේ ප්‍රභාකරන් කන්ඩායම කුඩු කර දැමීමේ දැවැන්ත ප්‍රයත්නයක් වෙනුවෙන්, මුරලිදරන්ට සහයෝගය දෙන ලෙස, මිලිටරියටත් ඇතුලුව, විශේෂයෙන් ම කුමාරතුංගට, කරන ආයාචනයකට ය.

මෙම ප්‍රකාශන, මිලිටරියේ හා රාජ්‍ය යන්ත්‍රයේ කොටස් සිතන ආකාරය, පැහැදිලිවම පිලිඹිබු කරයි. භේදයට මැදිහත් වීමට දැරෙන ඕනෑම ප්‍රයත්නයක් — විවෘතව හෝ අවෘතව — හුදෙක් එල්ටීටීඊ කන්ඩායම් දෙක අතර සටනක් ඇවිලවීමේ පමනක් නො ව, සිවිල් යුද්ධය කරා ආපසු යාමේ ද සැබෑ තර්ජනය දරා සිටී.